PR/2019/ S14

# ජපන් තානාපති කාර්යාලය

නො.20, ශ්‍රීමත් ආර්.ජී.සේනානායක මාවත, කොළඹ 07

දුරකථනය: 94-11-269-3831~3, ෆැක්ස්: 94-11-269-8629
ඊ-මේල්: cultujpn@sltnet.lk

මාර්තු 11, 2019

## පුවත්පත් නිවේදනය

**ජපානයෙන් මාලඹේ - කොළඹ කොටුව සැහැල්ලු දුම්රිය පද්ධතිය සඳහා රුපියල් බිලියන 48 ක්.**

ජපන් රජය මගින් මාලඹේ - කොළඹ කොටුව සැහැල්ලු දුම්රිය පද්ධතිය ඉදිකිරීම සඳහා ජපන් යෙන් බිලියන 30.04 ක (රුපියල් බිලියන 48) සහන ණය පැකේජයක් ශ්‍රී ලංකාවට ලබා දේ. මෙමගින් ශ්‍රී ලංකාවේ මාර්ග ජාලය වැඩිදියුණු කිරීම සහ මාර්ගයන්හි වාහන තදබදය අවම කිරීම අරමුණු කෙරේ.

මෙම යෝජිත සැහැල්ලු දුම්රිය මාර්ගය මගින් කොළඹ වාණිජ නගරය සහ මාලඹේ නාගරික ප්‍රදේශය අතර සම්බන්ධතාවය වැඩිදියුණු කිරීමට සැලසුම් කරඇත. මෙම මාර්ගය 15.7 km පමණ දිගු වන අතර දුම්රිය ස්ථාන 16කින් යුක්ත වේ. මෙමගින් කොළඹ කොටුව සහ මාලඹේ නගරය අතර බත්තරමුල්ල හරහා ගමන් කාලය මිනිත්තු 30කින් පමණ අඩු කෙරේ. ඉතා සහනදායී කොන්දේසි යටතේ මෙම යෙන් ණය මුදල ලබාදෙන අතර එය අවුරුද්දකට 0.1% පොළී අනුපාතිකයකට, අවුරුදු 12ක සහන කාලයක් සහිත අවුරුදු 40ක ආපසු ගෙවීමේ කාලයකට යටත්ය.

මෙම ව්‍යාපෘතිය යටතේ 15.7km දුම්රිය මාර්ගය, දුම්රිය ස්ථාන සහ දුම්රිය ඩිපෝව ඉදිකිරීම, අවශ්‍ය සැහැල්ලු දුම්රිය මිලදීගැනීම සහ සන්නිවේදන සහ සංඥා පද්ධති සවිකිරීම යන කටයුතු සිදුකෙරේ. ආරක්ෂිත, පහසු සහ විශ්වාසනීය මගී ප්‍රවාහන පද්ධතියක් ලබාදීම මගින් ශ්‍රී ලංකාවේ සමාජ හා ආර්ථික සංවර්ධනයට දායකවීමට ජපන් රජය බලාපොරොත්තු වේ.

මෙම ව්‍යාපෘතියට අදාල හුවමාරු පත්‍ර සඳහා අත්සන් තැබීම, 2019 මාර්තු 11 දින ජපන් තානාපති අකිරා සුගියාමා මහතා සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආර්. එච්. එස්. සමරතුංග මහතා විසින් මුදල් අමාත්‍යාංශයේදී සිදුකරන ලද අතර ඉන් අනතුරුව මෙම ව්‍යාපෘතියට අදාල ණය ගිවිසුමට අත්සන් තැබීම, ශ්‍රී ලංකාවේ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ (JICA) ප්‍රධාන නියෝජිත ෆුසාටො තනාකා මහතා සහ ආර්. එච්. එස්. සමරතුංග මහතා අතර සිදු කෙරිණි. (නිමි)

************************************************************

වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න.
සංවර්ධන සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලය
දුරකථනය : 011-2693831-3 දිගු අංකය: 280